002

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

අධ්‍යාපන පීඨය

විශේෂ අවශ්‍යතා අධ්‍යාපනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා වැඩසටහන - 2020/2021

අවසාන පරීක්ෂණය - 2022

අධ්‍යාපනයේ මාර්ගෝපදේශනය හා උපදේශනය - SNP8338/ESP2138

කාලය - පැය තුනයි. (03)

---

දිනය - 2022.09.18 වේලාව - පෙ.ව.09.30 - ප.ව.12.30 දක්වා

---

1 වන කොටසේ සියලුම ප්‍රශ්න වලටද 2 වන කොටසින් ඕනෑම ප්‍රශ්න තුනකටද (03) පිළිතුරු සපයන්න.

## 1 වන කොටස

01. පාසල් වෘත්තීය මාර්ගෝපදේශනය හා උපදේශන සේවාවන්හි අරමුණු පහක් (05) දක්වන්න.

02. 'උපදේශනය සංවර්ධනාත්මක ක්‍රියාවලියක් ලෙස සැලකිය හැක.' මෙම වගන්තිය සුදුසු උදාහරණ ඇසුරෙන් සාධාරණීකරණය කරන්න.

03. විශේෂ අධ්‍යාපන අවශ්‍යතා සහිත සිසුන් තුළ ක්ලමථය (stress) ඇතිවීමට හේතුවන පාසල් පරිසරය ආශ්‍රිත සාධක තුනක් (03) පැහැදිලි කරන්න.

04. චර්යාවාදී ප්‍රතිකාරාත්මක ප්‍රවේශයේ මූලික දර්ශනය කෙටියෙන් පැහැදිලි කරන්න.

05. පාසල් මාර්ගෝපදේශන සහ උපදේශන සේවාවන්හි පසු විපරම් ක්‍රියාවලියේ ප්‍රතිලාභ තුනක් (03) සාකච්ඡා කරන්න.

06. උපදේශකවරයෙකුට ආචාර ධර්ම මාලාවක ඇති වැදගත්කම, විශේෂ අවශ්‍යතා සහිත ළමුන් සමඟ කටයුතු කිරීමේදී අදාළ වන හේතු දෙකක් (02) දක්වමින් පැහැදිලි කරන්න.

07. මනෝවිද්‍යාත්මක උපදේශනයේ අරමුණු තුනක් (03) සහ ඒවා විශේෂ අවශ්‍යතා සහිත දරුවන් සිටින දෙමාපියන්ට වැදගත් වන්නේ ඇයිදැයි පැහැදිලි කරන්න.

08. විශේෂ අවශ්‍යතා සහිත දරුවන්ට උපදේශන ශිල්ප ක්‍රම යොදා ගැනීමේදී මුහුණ පෑමට සිදුවන අභියෝග තුනක් (03) විස්තර කරන්න.

(ලකුණු 05 x 08 = 40)

**THE OPEN UNIVERSITY OF SRI LANKA**

**FACULTY OF EDUCATION**

**DEPARTMENT OF SPECIAL NEEDS EDUCATION**

**POSTGRADUATE DIPLOMA IN SPECIAL NEEDS EDUCATION PROGRAMME - 2020/2021**

**FINAL EXAMINATION - 2022**

**SNP8338/ESP2138 – EDUCATIONAL GUIDANCE AND COUNSELLING**

**DURATION – THREE (03) HOURS**

Date: 18.09.2022 Time: 9.30 a.m. – 12.30 p.m.

**Answer All Questions in Part I and any three (03) questions from Part II.**

## PART - I

01. State **five (05)** objectives of school career Guidance and Counselling services.

02. 'Counselling can be considered as a developmental process'. Justify this statement with relevant examples.

03. Explain **three (03)** factors related to the school environment causing stress in students with special educational needs.

04. Explain briefly the basic philosophy of Behavioural Therapeutic Approach.

05. Discuss **three (03)** benefits of the follow up process in school guidance and counselling services.

06. Explain the importance of the code of ethics to the counsellor by stating **two (02)** reasons in relation to working with children with special needs.

07. Explain **three (03)** objectives of Psychological Counselling and explain why it is important for parents with special needs children.

08. Describe **three (03)** challenges when applying techniques of counselling to the children with special needs.

(5 x 8 = 40 marks)

## 2 වන කොටස

09. ගුරුවරයෙකු ලෙස ඔබගේ පන්තිකාමරයේ දී විවිධ දුබලතා සහිත සහ සුවිශේෂී හැකියාවන් සහිත සිසුන් ඔබට මුණ ගැසෙනු ඇත.

(i) කථන ගැටලු සහිත ළමුන් තුළ විද්‍යාමාන වන පොදු ලක්ෂණ තුනක් **(03)** දක්වන්න. (ලකුණු 03)

(ii) කථනාබාධ සහිත දරුවන්ගේ ඉගෙනුම් සුසාධ්‍යකරණය කිරීම සඳහා ගුරුවරයෙකුට අනුගමනය කළ හැකි ක්‍රියාමාර්ග තුනක් **(03)** පැහැදිලි කරන්න. (ලකුණු 09)

(iii) සුහග ළමුන්ට විශේෂ අවධානයක් ලබාදීමේ ඇති වැදගත්කම හේතු දෙකක් **(02)** දක්වමින් සාකච්ඡා කරන්න. (ලකුණු 08)

10. විශේෂ අවශ්‍යතා සහිත දරුවන්ගේ සමායෝගී බව අරමුණු කරගත් පාසල් වැඩසටහන් සංවිධානය කිරීමේදී සැලකිලිමත් විය යුතු සුවිශේෂී අංශ ඇත.

(i) 'සමායෝගීබව' යන සංකල්පය සුදුසු නිර්වචනයක් දක්වමින් විස්තර කරන්න. (ලකුණු 04)

(ii) (අ) විශේෂ අවශ්‍යතා සහිත දරුවන් තුළ සමායෝගී පෞරුෂයක් සංවර්ධනය කිරීම අරමුණු කරගත් ක්‍රියාකාරකම් සහිත වැඩසටහනක් සැලසුම් කිරීමේ දී සලකා බැලිය යුතු සුවිශේෂී අංශ දෙකක් **(02)** සඳහන් කරන්න. (ලකුණු 02)

(ආ) ඔබ ඉහත සඳහන් කළ එක් සුවිශේෂී අංශයක් ඉටු කර ගැනීම සඳහා ක්‍රියාත්මක කළ හැකි ක්‍රියාකාරකම් තුනක් **(03)** පැහැදිලි කරන්න. (ලකුණු 06)

(iii) ඉහත සඳහන් කළ ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීමේ දී ගුරුවරයෙකුට මුහුණ දීමට සිදුවිය හැකි අභියෝග දෙකක් **(02)** සහ එම එක් එක් අභියෝගය ජය ගැනීම සඳහා සුදුසු පිළියමක් බැගින් සාකච්ඡා කරන්න. (ලකුණු 08)

11. (i) 'ඉගෙනුම් දුබලතා' යන පදය පැහැදිලි කරන්න. (ලකුණු 03)

(ii) ඉගෙනුම් දුබලතා සහිත ප්‍රාථමික පාසල් සිසුන් කෙරෙන්, පහත සඳහන් අංශවල විද්‍යාමාන වන අනතුරු ඇඟවීමේ සංඥා විස්තර කරන්න. (එක් අංශයක් සඳහා දක්වන අනතුරු සංඥා තුනක් (03) බැගින් )

(අ) භාෂාව (ආ) සමාජයීය හැසිරීම (ලකුණු 09)

(iii) එවැනි දරුවන්ගේ ඉගෙනුම් හැකියාවන් වැඩි දියුණු කිරීම සඳහා ගුරුවරයෙකු ලෙස ඔබට ගත හැකි ක්‍රියාමාර්ග පැහැදිලි කරන්න. (ඉහත සඳහන් එක් අංශයක් සඳහා ක්‍රියාකාරකම් දෙකක් **(2)** බැගින් ) (ලකුණු 08)

## PART - II

09. As a teacher you may meet students with different disabilities and exceptional abilities within your classroom.

    i. State **three (03)** observable common characteristics of children with speech problems. (03 marks)

    ii. Explain **three (03)** strategies that can be followed by a teacher for facilitating the learning of children with speech problems. (09 marks)

    iii. Discuss the importance of providing special attention on gifted children by citing **two (02)** reasons. (08 marks)

10. There are special aspects which need to be considered when organizing school programmes aimed at special needs students' adjustment.

    i. Describe the concept of adjustment by citing suitable definition. (04 marks)

    ii. a. State **two (02)** special aspects which need to be considered when planning a programme of activities with the aim of supporting to develop personality adjustment of students with Special Needs. (02 marks)

       b. Explain **three (03)** activities that can be implemented to achieve one special aspect that you mentioned above. (06 marks)

    iii. Discuss **two (02)** challenges that a teacher may be faced during the implementation of above mentioned activities and a suitable remedial measures for each challenge.

    (08 marks)

11. i. Explain the term learning disabilities. (03 marks)

    ii. Describe warning signs exhibited by primary grade students with learning disabilities under the following areas. (three warning signs for each area)

       a. Language

       b. Social behaviour.

    (09 marks)

    iii. Explain the actions (two actions for each area) that you can take as a teacher to assist such children to enhance their learning abilities

    (08 marks)

12. (i) සංදෘෂ්ඨිකවාදී ප්‍රතිකාරාත්මක ප්‍රවේශයේ මූලික දර්ශනය පැහැදිලි කරන්න. (ලකුණු 04)

(ii) සංදෘෂ්ඨිකවාදී ප්‍රතිකාරාත්මක ප්‍රවේශයේ ප්‍රතිකාරාත්මක ක්‍රියාවලියේ ස්වභාවය විස්තර කරන්න. (ලකුණු 08)

(iii) (අ) සංදෘෂ්ඨික ප්‍රතිකාර මගින් ප්‍රතිකාර කළ හැකි සේවාදායකයන වර්ග දෙකක් **(02)** දක්වන්න. (ලකුණු 02)

(ආ) මෙම ප්‍රතිකාරාත්මක ප්‍රවේශයේ ප්‍රධාන සීමාකම් දෙකක් **(02)** සාකච්ඡා කරන්න. (ලකුණු 06)

13. (i) පන්තිකාමරයේදී දුබලතා සහිත සිසුන් මුහුණ පාන ගැටලු තුනක් **(03)** පැහැදිලි කරන්න. (ලකුණු 06)

(ii) අන්තර්කරණ පන්තිකාමරයකදී ගුරුවරයෙකුට මුහුණ පෑමට සිදුවන අභියෝග තුනක් **(03)** විස්තර කරන්න. (ලකුණු 06)

(iii) අන්තර්කරණ පන්තිකාමරයක් තුළ උගන්වන ගුරුවරයාට සහ, එහි සිටින දුබලතා සහිත සිසුන්ට සහාය වීමේ දී පාසල් උපදේශකවරයාගේ කාර්යභාරය සාකච්ඡා කරන්න. (ලකුණු 08)

14. නිරීක්ෂණය, පරීක්ෂණ නොවන උපදේශන සේවා ශිල්ප ක්‍රම අතරින් ඉතා ප්‍රයෝජනවත් ශිල්ප ක්‍රමයකි.

(i) නිරීක්ෂණයක් සිදු කරන විට උපදේශකවරයෙකු සලකා බැලිය යුතු සාධක හතරක් **(04)** පැහැදිලි කරන්න. (ලකුණු 08)

(ii) විශේෂයෙන්, විශේෂ අවශ්‍යතා සහිත සිසුන් පිළිබඳව දත්ත එක් රැස් කිරීමේදී, උපදේශන ශිල්ප ක්‍රමයක් ලෙස නිරීක්ෂණය යොදා ගැනීමේ ඇති ප්‍රයෝජන තුනක් **(03)** විස්තර කරන්න. (ලකුණු 06)

(iii) 'විශේෂ අවශ්‍යතා සහිත සිසුන්ට මාර්ගෝපදේශන සහ උපදේශන සේවාවන් වඩාත් අවශ්‍යය වේ.'

හේතු තුනක් **(03)** පැහැදිලි කරමින් මෙම වගන්තිය සාධාරණීකරණය කරන්න.

ලකුණු 06)

හිමිකම් ඇවිරිණි.

12. i. Explain the basic philosophy of Existential Therapeutic approach.

(04 marks)

ii. Describe the nature of the therapeutic procedures that use in the Existential Therapeutic approach. (08 marks)

iii. a. State **two (02)** types of clients that can be treated by the Existential Therapy.

(02 marks)

b. Discuss **two (02)** major limitations of this therapeutic approach.

(06 marks)

13. i. Explain **three (03)** problems faced by Disabled students in the classroom.

(06 marks)

ii. Describe **three (03)** challenges faced by the teacher in an inclusive classroom.

(06 marks)

iii. Discuss the school counsellor's role in assisting disabled students and the teacher, teaches in an inclusive classroom.

(08 marks)

14. Observation is a very useful technique among the non-testing techniques of counselling.

i. Explain **four (04)** factors that should be considered by a counsellor when conducting an observation.

(08 marks)

ii. Describe **three (03)** benefits of observation as a technique of counselling specially when it uses for collecting data about students with special needs.

(06 marks)

iii. 'Assistance of Guidance and Counselling services are very much needed for students with special needs' Justify this statement by explaining three (03) reasons.

(06 marks)

*-Copyrights reserved-*